ඇඹිලිපිටිය කලාපය

දෙවන වාරය පාඩම් මාලාව - 2020 - 8 ශ්‍රේණිය

09. අවුරුදු සිහිනය - දෙවන පාඩම

- 'පියසේන තම මව එනතුරු බලා සිටීම' නමැති ප්‍රධාන සිදුවීම වටා එය පහසුවෙන් නිර්මාණය කිරීම සඳහා අතුරු සිදුවීම් කිහිපයක්ම ගෙන හැර දක්වා ඇත.
  ~ ස්වාමිදුව පියසේනගෙන් වැඩකරවා ගන්නා ආකාරය.
  ~ යන්තමින් හෝ පියසේනට කරුණාවක් දැක්වූ කුස්සියේ අම්මා ලවා අම්මාට ලියුමක් ලියවා ගැනීම.
  ~ නූල් රෝද දෙකක් ගෙන ඒමට ගිය පියසේන,'කොබෝගම' සහ 'අම්මා' පිළිබඳ හමුවන සියලුදෙනාගෙන් විමසීම.
  ~ ඒ සියලු දෙනාම පියසේනගේ අවශ්‍යතාව හඳුනා නොගෙන,මායිම් නොකර බැණ වැදීම.
  ~ විසිතුරු බඩු වෙළෙන්දා විසින් පියසේන රැවටීම.
- මෙවැනි සිදුවීම් සමාජයේ බොහෝ තැන්වල දැකගත හැක.අසරණ වූ පසු බලය ඇති බොහෝ අය මෙවන් අයුක්ති සහගත ක්‍රියාවන්හි නිරත වේ.
- මෙහි ප්‍රධාන සිද්ධිය පියසේනගේ බලා සිටීමයි.ඒ වටා එය අලංකාරව ගොඩ නගා ගැනීමට සුළු නමුත් අත්‍යවශ්‍ය සිදුවීම් එකතු කරගෙන ඇත.
- මේ එකඳු සිදුවීමක් හෝ ඉවත් කළහොත් කතාවේ සුන්දරත්වය බිඳීවැටේ.
- සිදුවීම් පෙළගස්වා ඇත්තේ අනුපිළිවෙළට ය.
- පෙර සිද්ධියේ ප්‍රතිපලයක් ලෙස ඊළඟ සිද්ධිය ගොඩනගා ඇත.සිද්ධි එකකට එකක් සම්බන්ධ වී ඇත.
- මෙහි ඇත්තේ එක් ප්‍රධාන චරිතයකි.'පියසේන' වටා අනෙක් සියලු චරිත නිර්මාණයකර ඇත.ස්වාමිදුව,කුස්සියේ අම්මා,වෙළෙන්දන් සුළු චරිත වේ.
- ඔහු මග බලා සිටිනා අවස්ථාව මැවෙන පරිදි පරිසරය පිළිබඳ විස්තර කර ඇත.
- කියවන්නාට කුතුහලය නැගෙන ආකාරයට ගුණදාස අමරසේකර කෙටිකතාකරුවා තම භාෂාව යොදාගෙන ඇත.පියසේනට අතීතය මතක්වන ආකාරය ඊට උදාහරණයකි.
- දීර්ඝ කතාවක් නොවන අතර මෙය කොට කතාවක් ද නොවේ.මෙහි ඇත්තේ හේතුඵල සම්බන්ධය අනුව නිර්මාණය වුණු කතාන්දරයකි.
- මේ ආකාරයට කෙටිකතාව ඉතා සුන්දර නිර්මාණයකි.

පැවරුම්

1. කෙටිකතාවක ලක්ෂණ මොනවාද?
2. මෙහි ඇති එක් එක් චරිත පිළිබඳ වෙන වෙනම විස්තර කරන්න.
3. මෙහි එන සිද්ධි හා චරිත එකිනෙකට ගැළපේදැයි පරීක්ෂාකර බලන්න.